# සුබස් සිතිවිලි

පසුගිය අප්රේල් කලාපයේ සුබස් සිතිවිලි ලිපියේ දෙවන කොටසය් මේ.

පහත දැක්වෙන අංක 1 වැකි එදා වහරත් අංක 2 වැකි අද වහරත් දක්වය්.

* 1. ඒ/හේ (තෙමේ) හඬය්/හැඬීය.
2. ඔහු හඬය්/හැඬීය.
1. ඔහු (තුමූ) හඬත්/හැඬූ හ
2. (ඔහුහු) ඔව්හු හඬත්/හැඬූ හ.
1/2. ඔහුට/ඔව්න්ට හැඬේ.
1/2. අහා, ඔහු / ඔව්න් හඬන හැටි !

* 1. ඕ/හෝ (තොමෝ) හඬය්/හඬූ හ.
2. ඈ හඬය්/ හැඬුවාය (හැඬීය).
1. ඔහු (තුමූ) හඬත්/හැඬූ හ
2. (ඔහුහු) ඔව්හු හඬත්/හැඬූ හ.
1/2. ඈට/ඔව්න්ට හැඬේ.
1/2. අහා, ඈ/ ඔව්න් හඬන හැටි !

* 1. මේ (තෙමේ) හඬය්/හැඬී ය.
2. මොහු හඬය්/හැඬී ය.
1. මොහු (තුමූ) හඬත්/හැඬූ හ
2. (මොහුහු) මොව්හු හඬත්/හැඬූ හ.
1/2. මොහුට/මොව්න්ට හැඬේ.
1/2. අහා, මොහු / මොව්න් හඬන හැටි !



වි ක ධර්මබන්ධු

* 1. ඒ/හේ (තෙමේ) හඬය්/හැඬීය.
2. ඔහු හඬය්/හැඬීය.
1. ඔහු (තුමූ) හඬත්/හැඬූ හ
2. (ඔහුහු) ඔව්හු හඬත්/හැඬූ හ.
1/2. ඔහුට/ඔව්න්ට හැඬේ.
1/2. අහා, ඔහු / ඔව්න් හඬන හැටි !

* 1. මෝ (තොමෝ) හඬය්/හඬූ හ.
2. මෑ හඬය්/ හැඬුවාය (හැඬීය).
1. මොහු (තුමූ) හඬත්/හැඬූ හ
2. (මොහුහු) මොව්හු හඬත්/හැඬූ හ.
1/2. මෑට/මොව්න්ට හැඬේ.
1/2. අහා, මෑ/ මොව්න් හඬන හැටි !

එදා, අන්‍ය (ප්‍රතම) පුරුෂ '(එ හු) ඔහු'

එදා, අන්‍ය (ප්‍රතම) පුරුෂ '(ඎහු) බහු' බහු වචන උක්තය හැටියටත් ඒක වචන අනුක්තය හැටියටත්ය භාවිතා වූයේ,

(ඔහු හඬත් - අහා, ඔහු හඬන හැටි!) ඒක වචන උක්තය වූයේ 'හේ' ය. (හේ හඬය්) අද 'හේ' ආ ගිය අතක් නැත. ඒක වචන උක්තය හැටියටත්, ඒක වචන අනුක්තය හැටියටත් 'ඔහු' භාවිතා වේ. (ඔහු හඬය් - අනේ, ඔහු හඬන හැටි ෟ) බහු වචන උක්තය සඳහා ඎ හූ, හු = ඔහුහු ඔවුහු ඔව්හු යන වචනයක් හදාගෙන ඇත.

බහු වචන උක්තය හැටියටත්, ඒක වචන අනුක්තය හැටියටත් භාවිතා වූ 'මොහු' අද ඒක වචන උක්තය හැටියටත් ඒක වචන අනුක්තය හැටියටත් භාවිතා වේ. (මොහු හඬය් - අනේ, මොහු හඬන හැටි ෟ)බහු වචන උක්තය සඳහා (මොහු හු = මොවුහු) මොව්හු' යන වචනය හදාගෙන ඇත.

'ඕ/මෝ' යන ඉතිරි ලිඟු ඒක වචන පදවල අතීත කාල ආඛ්‍යාතය සඳහා බහු වචන ආඛ්‍යාතය භාවිතා විය. ('ඕ/මෝ/කෙල්ල/අම්මා හැඬූහ.)

අද ඈ /මෑ යන පද උක්තය සඳහාත් අනුක්තය සඳහාත් භාවිතා වේ. (ඈ/මෑ/කෙල්ල/අම්මා හඬය්-අනේ, ඈ /මෑ /කෙල්ල /අම්මා හඬන හැටිෟ )
අනෙක් වෙනස නම් ආඛ්‍යාතය වෙනුවට 'හැඬුවාය' යන ඒක වචන නාමක්‍රියාව භාවිතා කිරීමයි.

'හඬය්' යන ශුද්ධ ආඛ්‍යාතය යෙදූ තැන් දක්නට ලැබෙන්නේ කලාතුරකිනි. (ඈ /ඕ / කෙල්ල / අම්මා හැඬුවා ය.)
අනම්‍යාදේශය යනු 'අ-උ-ඹ' යන අකුරු තුන' ඇ - ඉ-එ- යන අකුරු තුනට මාරු වීමය්.

'නටු' 'ම' 'නැටි' වන්නේත් 'තටු' ම' 'තැටි' වන්නේත් 'අඳුරු' ම' ඇඳිරි' වන්නේත් 'අ-උ' යන අකුරු දෙක 'ඇ-ඉ' වීම නිසා ය. සඳ ෲ අලු ූ සඳලු - සැඳැලි වේ.

'කොට' ම 'කෙටි' වන්නේත් කොකු ම 'කෙකි' වන්නේත් 'පොහොවස් ? ම' පෙහෙවස්' වන්නේත් 'උ-ඹ' යන අකුරු දෙක 'ඉ-එ' වීම නිසා ය.
මේ රීතිය හැම තැනම හැම විටම සිදු නොවේ. 'තරු මලු' යන පද 'තැරී, මැලි' නොවන්නේත්, දොලොස්, ගොහොදු' යන පද' දෙලෙස්, ගෙහෙදි' නොවන්නේත් ඒ නිසාය.

සිය බසේ 'අ- ඹ' වීමත් 'ඹ- අ' වීමත් ඉතා සුලබව දක්නට ලැබේ. ඒ රීතිය කුමක්දැයි වියරණ පොත්වල දක්නට නැත. සමහර පොතක තිබිය හැකිය. මම නුදුටුවෙමි. පල - පොල (ගම්පොල), පත - පොත (කිරුලපොන) ගාල්ල - ගොල්ල (හොරගොල්ල) වැනි පදවල 'අ' යන්න 'ඹ' යන්න වී ඇත.

අලියාට කොටය ඇද ගෙන යෑම සඳහා කොටයේ එක් කොනක සිදුරක් හාරනු ලැබේ. ඒ සිදුර තුලින් කඹයක් යවා එය අලි කටට දුන් පසු උෟ ඒ කොටය ඇදගෙන යය්. කොටයේ ඒ කොන 'අලිකොන' -'අලිකන' වී ඇත. උමංදාවේ 'බිතු කොන - බිත කොන - බිත(ක්) කන - බිතක්කන' යන වචනය දෙන්නේ බිතු දෙකක් පිට පැත්තෙන් හා වන කොනය. ඇතුල් පැත්තේ ඇත්තේ 'මුල්ල' ය්. 'කොල වැද්දා' ම 'කලවැද්දා' වී ඇතැය් සිතමි. ගිරි දොර - ගිරිදර, ගම් දොර, ගන්දර, දෙවුම් දොර ? දෙවින්දර යන තැන් වල 'ඹ' යන්න 'අ' යන්න වී ඇත. 'ස්වර සාම්‍යය' එතැන සිදු වී ඇතැය් සිතමි.

කැරැල්ල - කැරැලි - කැරලි (ලනු කැරලි - කැරලි ගහනවා), කැමැත්ත - කැමැති - කැමති (කැමති වෙනවා), පැලැල්ල-පැලැලි, පැලලි (ලොල්ලතු/බට පැලලි) යන තැන් වල 'ඇ' යන්න 'අ යන්න වී ඇත්තේ (සුකෝච්චාරනය) කියවීමේ පහසුව නිසාය. වියරන පොත්වල එය සඳහන් වෙත් දැය් නොදනිමි.

දැනුම්වත් කිරීම- දැනුවත් කිරීම ('මි' ලොප් වී ඇත) කලූෲ වර ූ කලුවරූ කරුවල (පද පෙරලී ඇත)

සෙම් ප්‍රතිශ්‍යාව = සෙම් පිරිසාව = හෙම්බිරිසාව ('ප්‍රති' සිංහලට බිඳෙන්නේ 'පිලි' යනුවෙන් (පිලිම/පිලිතුර) උවත් මෙතන බිඳී ඇත්තේ 'පිරි' යනුවෙනි. 'පි' යන්න 'බි' යන්න වී ඇත) මේ පද කියවීමේ පහසුව සලකා වෙනස් කර ඇතැය් සිතමි.

පාෲ අත්ූ පාත් ූ පහත් වීම, ඉංගිරිසි වචන සිංහලට බිඳ ගැනීම සඳහා කරන ඉගියකි. පාක්, කාට්, කාඩ්, පාත්, ෆාම්, යාඩ්, පෝට්, බාල් (බෝල්) මෝල්, මේල්, මීල් ඒ අනුව කියා බලන්න. වර නගා බලන්න.

එදා සුඟ / (හුඟ) භාවිතා උනේ ටික /කුඩා යන තේරුම දීමටය්. සහල් සුඟක්, ඉඟ සුඟ, සුඟුන් (ලමා ලපටියන්) ආදී වශයෙන් භාවිතා වූ සුඟ/හුඟ අද හුඟ දෙනෙක්, හුඟ දවසක්, හුඟක් බර, හුඟක් ගනං ආදී වශයෙන් බොහෝ යන තේරුම දීම සඳහා භාවිතා වේ.

'දුරු රට සිට පැමිනියහු' , 'බසින් නොකෙලෙමි එදා මොහු දුරු' 'ඇද වත්කරමු' පපුවේ හුනුලේ වතුරු' වතුරුග ආදී වශයෙන් යෙදුනු දුරු / වතුරු යන වචන අද දුරුෲ අ - දුර, වතුරුෲ අ, වතුර යනු වෙන් විබත් ගන්වා' දුර රටක සිට පැමිනි, වතුර කලේ/මල යනුවෙන් භාවිතා වේ.

හස්ත, අත්, හස්ති, = ඇත් වී ඇති ඇති නිසාදෝ අස්ථි/අට්ඨි යන්න 'ඇට' වී ඇත. උකුල් ඇටය, ඇට සැකිල්ල යන තැන්වල (bone) බොහොත් ' සඳහාත්, ඇටකෙහෙල් මුං ඇට යන තැන්වල බීජ /බීජු (seed-සිහිඩ්) සඳහාත් 'ඇට' භාවිතා වේ. 'බිජ' යන්න කඩිබිජු, හූනුබිජු තාර බිජු ආදී වශයෙන් අන්ඩ/බිජුවට/බිත්තර සඳහා ද යෙදේ. බිජුෲ අූ බිජුව-බිජ්ජ ආදී බාවිත වන්නේ වෙනත් තේරුමක් දීම සඳහා ය. එය ගත් වහරට නුසුදුසු වචනයක් සේ සලකා ඒ තේරුම දිමට බීජ කෝසය, අන්ඩ කෝසය, වෘශන කෝසය වැනි වචන භාවිතා වේ.

වටකුරු හැඩය නිසා හැදුනු සේ පෙනෙන 'වටෲ බිජු' පද පෙරලියකින් 'බිජුවට' යන තනි පදයක් සේ සකස් වී ඇතැය් සිතමි.
රන්-මසු-
මසු-රන්
මසුරන් වීම වැනිය. එසේ හැදුනු 'බිජුවට' පසුව තල, වී වැනි ඇට සඳහාත් භාවිතා වන්නට ඇත.

පොල් ගෙඩියේ ඇටය පොල් ගෙඩිය වී පොල් ගෙඩි ලෙලි පොල් හෙවත් ගෙඩි පොල් වී ඇත. ගෙඩි අඹ, ගෙඩි කොස්, ඇති නොවන්නටත් ගෙඩි පොල් ඇති වන්නටත් හේතුව දැන් ඔබට තේරුම් ගත හැකිය. වැඩකට ගත නොහැකි යමක් කෙනෙකුට දීම 'බල්ලන්ට ලෙලි පොල් දීමක්' වැන්න.

මුං බීජු තල බීජ අද මුං ඇට තල ඇට වී ඇති අතර කුකුල් බිජු තාර බිජු, කුකුල් බිත්තර තාර බිත්තර වි ඇත.
'ඇට කටු' යන වචනය හැදෙන්නට හේතු උනේ 'තදතාව' හෝ 'උල්තාව' විය හැකිය. කටු ඉඹුල කටු වැල් බටු, කටු කුරුඳු උල්තාව නිසාත් පොල්කටු ඉබිකටු, බෙලි කටු තදතාව නිසාත් හැදෙන්නට ඇත.

# මහා ගත්කරු ජී. බී.සේනා- නායක විශාදයෙන් (Depression) පෙලුනේද?



වෛද්‍ය රුවන් එම්. ජයතුංග

ප්‍රතිභාපූර්ණ ලේඛකයෙකු ලෙස ජී. බී.සේනානායක දක්වන ලද කුසලතාව තවමත් ඇගයීමකට ලක් නොවී ඇතැයි මා සිතමි. ඔහුගේ මේධා, චාරුමුඛ වැනි නවකථා ද සාහිත්‍ය විග්‍රහය, සාහිත්‍ය සේසත් වැනි ශාස්ත්‍රීය ග්‍රන්ථ ද දුප්පතුන් නැති ලෝකය, පළිගැනීම වැනි කෙටි කථා සංග්‍රහයන් ද පෙන්වා දෙනුයේ අග්‍ර ගණ්‍යයේ ලේඛකයෙකුගේ ප්‍රතිභාවන්ය. ජී. බී.සේනානායක පවසන පරිදි ඔහුගේ රචනා වලින් හෙලි කරන්නේ චිත්ත තත්වයන්ය.

ඔහුගේ කෘතීන් වල ගැඹුරු හරයක් අන්තර්ගතය. ඔහු පෙන්වා දෙන පරිදි ඔහුගේ විධිමත් අධ්‍යාපනය නිම වූයේ හත් වැනි ශ්‍රේණියෙනි. ඉන් පසු ස්ව උත්සාහයෙන්ම ඔහු උපන්නේය. විශාල ප්‍රමාණයක් කෘති කියවා තමාගේ දියුණුවේ නිම් වළලු පුළුල් කර ගත් ඔහු බුද්ධිමතෙකු ලෙස අවිවාදයෙන්ම පිළිගැනෙන්නෙකි.

ජී. බී.සේනානායකයන්ගේ කෘතීන් වල ඔහු විසින් අත් විඳි මෙලන්කෝලියාව (Melancholia) දක්නට තිබේ. මේ ස්වභාවය ඔහු තම නිර්මාණයන්ට ද මුසු කල බව පැවසිය හැක. මෙලෙස තම නිර්මාණයන් තුලට තමන්ගේ ආවේදනිකයන් මුසු කල ලේඛකයන්, කවීන් විශාල ප්‍රමාණයක් සිටිති. සුප්‍රකට ජර්මානු කවි ගතේ තමන් අත්විඳි මෙලන්කෝලියා තත්වය සිය නිර්මාණයන්ට මුසු කලේය. එසේම ටෝල්ස්ටෝයි, නිකොලායි ගොගොල්, ඩිකන්ස්, එඩ්ගා ඇලන් පෝ වැන්නවුන් තමන්ගේ සෘණාත්මක චිත්තාවේගීය ප්‍රතික්‍රියා නිර්මාණයන් හරහා පෙන්වා දෙන ලදී.

*ඔහුගේ නිර්මාණ මිණි කැට වැනිය. එකී නිර්මාණ වල සාහිත්‍යමය මෙන්ම දාර්ශනික ගැඹුරක් තිබේ. චිත්ත තත්වයන් අරභයා ඔහු විසින් කරන ලද විවරණයන් සලකා බැලීමේදී ජී. බී.සේනානායක යනු ලාංකික දොස්තොයෙව්ස්කි ද යැයි සිතේ.*

මහා ගත්කරු ජී. බී.සේනානායකගේ කෘතීන් විමර්ශනය කරන විට ඔහු සාමාන්‍ය මෙලන්කෝලියාවෙන් හෝ ඊටත් එපිට වර්ධනය වූ විශාදයකින් පෙලුනේද යන්න පිළිබඳ සැක පහළ වෙයි.

විශාදය වූ කලී මානසික රෝග අතරින් බහුලවම දැකිය හැකි රෝගී තත්වයකි. ඇතැම් විට විශාදය මානසික රෝග අතර සෙම්ප්‍රතිශ්‍යාව වශයෙන්ද හැඳින්වෙන්නේ එය එතරම්ම සුලභව දක්නට ලැබෙන නිසාය.

විශාදය හෙවත් (Depression) ඇති වීම සදහා ජානමය සාධක, ජීවත් වන පරිසරයේ බලපෑම, මුහුන දෙන ක්ලෙමථකාරී තත්වයන්, ප්‍රජානන හේතූන් යනාදී කරුණු ගනනාවක් පර්යේෂකයන් විසින් පෙන්වා දී ඇත. එම නිසා ජී. බී.සේනානායකයන් තුල තිබූ ආවේදනික තත්වය කුමන හේතුවක් නිසා හට ගත්තේද යන්න එක එල්ලයේම පැවසීම අපහසුය.

විශාදය නිරන්තරයෙන්ම මනෝ භාවයන් සමග බැඳී පවතියි. විශාදයේ මධ්‍යගත ලක්ෂණය වනාහී මනෝ භාවයන්ගේ සහ චිත්තාවේගයන්ගේ අදුරුසහගත අවපාතයයි. බොහෝ විට මිනිසුන් අත් විඳින විශාදය නිසා ඔවුන්ගේ ප්‍රජානනය හීන වීම, නිර්මාණශීලීතාව අඩාල වීම දක්නට ලැබෙතත් ඇතැම් පුද්ගලයන් තමන් පෙලෙන විශාදය නිර්මාණකරණය සඳහා